දිනය : 2024.11.01
අංකය : 64

Sri Lanka Immigration & Emigration

**මාධ්‍ය නිවේදනයයි**

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

විදේශ ගමන් බලපත්‍ර මිලදී ගැනීම සඳහා ටෙන්ඩරය පිරිනමනු ලැබූ විදෙස් ආයතනය සමඟ ඇති කර ගෙන තිබූ ගිවිසුම් ප්‍රකාරව ‘P’ කාණ්ඩය යටතේ හිස් ගමන් බලපත්‍ර මේ වන විට 50,000ක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත.

මෙම ප්‍රමාණයට අමතරව නොවැම්බර් මස අගභාගයේදී තවත් 100,000ක පමණ හිස් ගමන් බලපත්‍ර ප්‍රමාණයක්ද දෙසැම්බර් මාසයේදී තවත් 150,000ක පමණ හිස් ගමන් බලපත්‍ර ප්‍රමාණයක්ද වන ලෙස 750,000ක හිස් විදෙස් ගමන් බලපත්‍ර තොගයක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරියේදී ලැබීමට නියමිතය. ඊට සමගාමීව තවත් හිස් ගමන් බලපත්‍ර තොගයක් ප්‍රසම්පාදනය කිරීමේ කටයුතු ද මේ වන විට ආරම්භ කොට ඇත.

ඉහත තත්ත්වය යටතේ මේ වන විට දිනකට 1,600ක පමණ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් අයදුම්කරුවන් වෙත නිකුත් කරනු ලබන අතර දෙසැම්බර් මස මුල සිට මෙම ප්‍රමාණය ක්‍රමයෙන් වර්ධනය කර අයදුම්කරුවන් විසින් ඉල්ලුම් කරනු ලබන ගමන් බලපත්‍ර ප්‍රමාණයට සරිලන ආකාරයට ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සකස් කිරීමට මෙම දෙපාර්තමේන්තුවට හැකියාව ලැබෙනු ඇත.

විධිමත් පරිදි දිනයක් හා වේලාවක් මාර්ගගත ක්‍රමය යටතේ වෙන් කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට මේ වන විට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, එම ක්‍රමවේදය නුදුරු දිනයකදීම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවද දැනුම් දෙනු ලැබේ.

පාලක ජනරාල් (වැ.බ.)
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව